Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2009** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

**Tuesday 20 October: 2 p.m. Eastern Standard Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 50 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 50 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2009*

**Part A** (Questions 1–3)
(20 marks)

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks** — You may make notes in this space.

**Text 1**

1. (a) Who is the target audience for this advertisement? **1**

(b) What is the aim of the advertisement? **1**

(c) Describe how the advertisement attempts to attract the attention of the audience. **3**

Marks

You may make notes in this space.

**Text 2**

2. (a) Describe the brother's mood as he entered the house. Support your answer with evidence from the text. **3**

(b) 'The brother is a kind-hearted person.' What evidence in the text suggests that this statement is true? **2**

(c) Why does the sister say 'One good deed deserves another'? **2**

Marks | You may make notes in this space.

**Text 3**

3. (a) The speaker says that the students should make three important changes to their habits. List the three changes. **3**

- ______________________________
- ______________________________
- ______________________________

(b) Why are these changes so important for our health? **3**

______________________________

______________________________

______________________________

(c) What final recommendations does the speaker give to the students? **2**

______________________________

______________________________

**Part B** (Questions 4–5)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

---

You will hear TWO texts, one relating to Question 4 and one relating to Question 5. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. (a) Explain the crisis faced by the producers of agricultural products for export. **2**

අපනයනය සඳහා කෘෂිකාර්මික භෝග නිපදවන්නන් මුහුණ පා ඇති අර්බුදය විස්තර කරන්න.

______________________________

______________________________

______________________________

(b) What **two** solutions to the problem are outlined in the news item? **2**

මෙම ගැටලුව සඳහා ප්‍රවෘත්ති ප්‍රකාශයේ පෙන්වාදී ඇති විසඳුම් දෙක කුමක්ද?

______________________________

______________________________

______________________________

Marks

You may make notes in this space.

**Text 5**

5. (a) Dr Yapa states that using polythene to wrap food is a disaster. What reasons does he give? **2**

කෑම එතීමට පොලිතීන් භාවිතා කිරීම ආපදාවක් ලෙස ආචාර්ය යාපා සඳහන් කරයි. ඒ සඳහා ඔහු දක්වන කරුණු මොනවාද?

______________________________

______________________________

______________________________

(b) What is Dr Yapa's new project? **2**

ආචාර්ය යාපාගේ අලුත් ව්‍යාපෘතිය කුමක්ද?

______________________________

______________________________

______________________________

______________________________

(c) Explain the announcer's comment 'It's like killing many birds with one stone' regarding this project. **2**

මෙම ව්‍යාපෘතිය පිළිබඳව 'එක ගලින් කුරුල්ලෝ කිහිප දෙනෙක් මරන්න පුළුවන්නේ' යනුවෙන් නිවේදිකාව විසින් කළ ප්‍රකාශය පැහැදිලි කරන්න.

______________________________

______________________________

______________________________

**End of Section 1**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2009 PUBLIC EXAMINATION

# Sinhala
## Continuers Level

### Section 2: Reading and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 15 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in blue or black ink or ball-point pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2009*

**Part A** (Questions 6–7)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

6. Read the text and then answer in ENGLISH the questions that follow.

## සීගිරිය

සීගිරිය නැරඹීමට යන ඕනෑම කෙනෙකුට ඒ පිළිබඳව දැන ගැනීමට කුතුහලයක් ඇතිවනු නොඅනුමානය. සීගිරියේ ගොඩනැගිලි ඉදිකර, එහි වාසය කළේ කාශ්‍යප රජු පමණක් බව මහා වංශයේ සඳහන් වේ. කාශ්‍යප රජු සීගිරියේ විසීමට හේතුවූ පසුබිම් කථාව මහා වංශයේ මෙසේ සඳහන් වේ.

පියාගෙන් රජකම උදුරාගත් තරුණ කාශ්‍යප කුමරු පසුව පියා සතු ධනය ඉල්ලීය. තමා ඉදි කළ කලා වැව, තම ධනය ලෙස පියා පෙන්වූ නිසා, කෝපයට පත් කුමරු පියා මැරීමට අණ කළේය. මෙයින් බියට පත් ඔහුගේ සොයුරු මුගලන් කුමරු ඉන්දියාවට පැන ගියේය. මුගලන් කුමරුන් යම් දිනයක සේනාවක් සමඟ පැමිණ, තමන් හා යුද්ධයට එතැයි සිතා කාශ්‍යප කුමරු සීගිරි බලකොටුව ඉදිකර එහි විසීය.

සීගිරිය බලකොටුවක් බව ඔප්පු කිරීමට, මහාචාර්ය සෙනරත් පරණවිතාන වැනි ඉතිහාසඥයෝ, සීගිරි කඳු මුදුනට මුලු වට පිටාවම පෙනෙන බැවින්, සතුරු සේනා පැමිණෙන විට දැකගත හැකි බවත්, සීගිරි ගල වටා ආරක්ෂක දිය අගලක් බඳවා තිබුණු බවත් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළහ. එ බැවින් මෙතෙක් කාලයක් සීගිරිය කාශ්‍යප රජුගේ බලකොටුව ලෙස පිළිගෙන තිබුණි.

මෑතකදී මහාචාර්ය සිරි ගුණසිංහ මහතා සීගිරිය පිළිබඳව අලුත් මතයක් ඉදිරිපත් කළේය. ඒ අනුව කාශ්‍යප රජු රජ කළේ අනුරාධපුර නගරයේ සිට බවත්, සීගිරිය බලකොටුවක් නොව, රජුගේ විනෝද උයනක් පමණක් බවත් ප්‍රකාශ වේ. සතුරු සේනා සීගිරි ගල වට කර ගතහොත් එහි වාසය කරන අයට ගැලවී යා හැකිද? කාශ්‍යප - මුගලන් යුද්ධය සිදුවූයේ අනුරාධපුරයේදී නම්, ඔහු රජ කළේ සීගිරියේ නොව අනුරාධපුරයේ විය යුතු නොවේදැයි ඔහු ප්‍රශ්න කරයි. තවද, විසිතුරු උයන්, ඉතා උසස් තාක්ෂණයක් අනුව ක්‍රියාත්මකවන වතුර මල් සහ ගල්වල ඇඳි, අලංකාර සීගිරි අප්සරාවන්ගේ චිත්‍ර වැනි දෑ බල කොටුවක ලක්ෂණ නොවන බවද ඔහු ප්‍රකාශ කරයි.

මොන යම් හේතුවක් නිසා හෝ කාශ්‍යප රජු විසින් නිර්මාණය කළ සීගිරිය අද ලංකාවට මහත් කීර්තියක් ගෙන දෙන, පුදුම දනවන පැරණි තාක්ෂණයක් ප්‍රදර්ශනය කරන, විසිතුරු කලාගාරයක් ලෙසට මුලු ලොවම පිළිගෙන ඇත.

සාලිය සිල්වා

QUESTIONS

**Marks**

(a) Give one positive and one negative aspect of King Kassapa's character. **2**

(b) What are the views of the two professors regarding the building of Sigiriya? Describe the characteristics of Sigiriya that support each view. **6**

**View 1**

First characteristic

Second characteristic

**View 2**

First characteristic

Second characteristic

(c) Why do people still visit Sigiriya today? **2**

7. Read the text and then answer in ENGLISH the questions that follow.

## මහජන මතය

2009 ජනවාරි 5 වන දින නාලක පෙරේරා හම්බන්තොට සිට වාර්තා කරයි

හම්බන්තොට වරාය ඉදිකිරීම සහ වීරවිල අන්තර්ජාතික ගුවන් තොටුපළ ඉදිකිරීම යන ව්‍යාපෘති දෙක, දිවයිනේ නොදියුණු පළාත් සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලැබීය. කටුක දේශගුණය, දුරස්ථභාවය සහ දේශපාලන හේතූන් නිසා දකුණු පළාත මහාමාර්ග සහ වාරිමාර්ග පහසුකම් අඩු නොදියුණු පළාතක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ නොසලකා හැර තිබුණි.

එසේ වුවද මෙම ව්‍යාපෘති දෙකට ලැබුණු මහජන ප්‍රතිචාර දෙයාකාරය.

2007 වසරේ ඇරඹුණු හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉතා ශීඝ්‍රයෙන් සිදුවෙමින් පවතී. ගොවියෝ මෙම ව්‍යාපෘතියට තම ගොවි බිම් හා ගේදොර යට කිරීම ගැන විරුද්ධ නොවූහ. "අපගේ පුරුදු වාසස්ථාන, ගේදොර අහිමි වුවත්, ජලය සහ විදුලිය පහසුකම් ඇති නිවසක් සාදා ගැනීමට සිරිබෝ පුරයෙන් අලුත් ඉඩමක් සහ මුදල් අපට ලැබුණා. තාවකාලික පැල්පත් වාසීන්ට පවා උළු ගෙවල් ලැබුණා" යයි ගොවියෝ පැවසූහ. තම ධීවර බිම් අහිමිවූ මසුන් මරන්නන් කීවේ "ඒ වෙනුවෙන් අපට විශේෂ කොටසක් ඉදිවෙන බැවින් දුක්වීමට අවශ්‍යතාවයක් නැත" යනුවෙනුයි. එම ප්‍රදේශයේ සිටි ව්‍යාපාරිකයෙකු සඳහන් කළේ "මට රුපියල් ලක්ෂ විස්සක වන්දියක් සමඟ ඉඩමකුත් ලැබුණා. මට අලුතින් ව්‍යාපාරයක් පටන් ගන්න එය හොඳටම ප්‍රමාණවත්" යනුවෙනි. "රැකියා විරහිතව සිටි අපේ ළමයින්ට මෙම ව්‍යාපෘතියෙන් ස්ථිර රැකියා ලැබුණා" යයි තවත් අයෙක් පැවසූහ. සමස්තයක් ලෙස බොහෝ දෙනා තම උපන්බිම වෙනුවෙන් සහ අනාගත පරපුර වෙනුවෙන් යම් පරිත්‍යාගයක් කිරීමට ලැබීම ගැන සතුටු වූහ.

වීරවිල ගුවන් තොටුපළ ඉදිකිරීමේ ව්‍යාපෘතියට ලැබුණු ප්‍රතිචාරය මීට බොහොසෙයින් වෙනස් වූවකි. එනම් විරෝධතාවයකි. යෝධවැව, වීරවිල සහ ලුණුගම්වෙහෙර ප්‍රදේශවල ගොවියෝ තම ගොවිබිම් නැතිවීම ගැන නඩු මඟට බැස ජය ලැබූහ. අවතැන් වන ගොවියන් සඳහා වෙන් කළ ඉඩම් බුන්දල-විල්මැන්න කුරුලු අභයභූමියට අයත් බව පරිසරවේදීහු ඔප්පු කළහ. එමෙන්ම ගුවන්යානා ගමන් ගැනීම නිසා, කුරුලු අභයභූමියට පැමිණෙන සංචාරක කුරුල්ලන් කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි බවත්, උන් අනතුරට පත් විය හැකි බවත් ඔවුහු පෙන්වා දුන්හ. රජය මහජන මතයට හිස නමා මෙම ව්‍යාපෘතිය වෙනත් ප්‍රදේශයකට ගෙනයාමට එකඟ විය.

QUESTIONS

**Marks**

(a) Explain why the Southern Province is badly in need of development schemes. **3**

(b) What evidence in the text shows that people had a positive attitude to the Hambantota harbour project? **4**

(c) The airport project shows that 'Public opinion should be respected before implementing a project'. Justify this statement by referring to the text. **3**

**Part B** (Question 8)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

---

8. Read the text and then answer the question in 150–200 words in SINHALA on page 7.

ශ්‍රී ලංකා පරිසර සංගමයේ රැස්වීමකදී, සුසන්ත සිල්වා මහතා විසින් "ඛාදනය වෙමින් පවතින අපගේ මුහුදු වෙරළ" යන මාතෘකාව යටතේ පවත්වන ලද දේශනයේ සාරාංශය පහත සඳහන් වේ.

ඛාදනයට භාජනයවී ඇත්තේ දකුණු හා බටහිර වෙරළයි

හේතු - (1) වෙරළට ආරක්ෂාව සැපයූ බාධක විනාශවීම.

උදාහරණ - ජීවනෝපායක් ලෙසින් හුණු නිෂ්පාදනයට කොරල් කැඩීම, සංචාරක හෝටල් වලින් මුහුදට එක්වන අපද්‍රව්‍ය නිසා කොරල්පර දියවීයෑම.

(2) සැලසුම් රහිතව වෙරළ ආසන්නව සංචාරක හෝටල් ඉදි කර, කොන්ක්‍රීට් බැම් බැඳීමෙන් වෙරළ සීමාවීම.

සිදුවී ඇති හානි - ගොඩබිම් ප්‍රමාණය අඩුවීම

මිනිස් වාසස්ථාන විනාශවී යෑම

මාර්ග, වරාය, ගොඩනැගිලිවලට හානි සිදුවීම

පොල් වගාව, සංචාරක සහ ඛණිජ වැලි කර්මාන්තවලට ඇතිවන තර්ජනය

මුහුද ආශ්‍රිත කිරින්ද, දෙවුන්දර, ගාල්ල කොටුව හා මාතර කොටුව වැනි ඓතිහාසික ස්ථාන විනාශවී යෑම

පිළියම් - (1) කොරල්පර කැඩීම තහනම් කර, දඬුවම් නියම කිරීම

(2) වෙනත් රැකියා මාර්ග සලසා දීම

(3) සංචාරක හෝටල් ඉදිකිරීමේදී නීති පැන වීම

(4) වෙරළ ආරක්ෂා කරන පඳුරු වැවීම

QUESTION

Write an informative report of 150–200 words in Sinhala for a local newspaper, based on the summary of Mr Silva's speech, in order to educate people about this situation.

සිල්වා මහතාගේ දේශනයේ සාරාංශය පදනම් කරගෙන, මෙම තත්ත්වය පිළිබඳව ජනතාව දැණුවත් කිරීමට වචන 150-200 අතර වන, විස්තරාත්මක වාර්තාවක්, ප්‍රාදේශීය පුවත්පතකට සිංහලෙන් ලියන්න.

*Do not remove this page from the question booklet.*

Student/Registration Number | | | | | | | | | | | |

Centre Number | | | | | | |

Sinhala Continuers Level

Question 8



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2009 Public Examination

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (15 marks)

**Instructions to Students**

1. Allow approximately 45 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© *Victorian Curriculum and Assessment Authority 2009*

**Section 3** (Questions 9–12)
(15 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in 200–250 words in SINHALA.

9. Write an article for your school magazine evaluating Year 12 ‘schoolies week’ celebrations held after the Year 12 examinations.

   12 වසර විභාගය අවසානයේදී, විනෝදාත්මකව සමරණ 12 වසර ‘සිසු සතිය’ පිළිබඳව ඇගයීමක් කරමින් ඔබේ පාසල් සඟරාවට ලිපියක් ලියන්න.

I0. Write the text of a speech to give at your school’s final graduation ceremony describing the valuable personal cultural experiences you had while on holiday in Sri Lanka.

   ශ්‍රී ලංකාවේ ගත කළ නිවාඩු කාලය තුළ ඔබට පෞද්ගලිකව අත්දැකීමට ලැබුණු සංස්කෘතික වටිනාකම් විස්තර කර, පාසල හැර යන අවසාන උත්සවයේදී, ඔබ පවත්වන කතාවේ පිටපතක් ලියන්න.

11. Your friend uses a luxurious modern car to travel even very short distances. Write the text of a dialogue you had with your friend to persuade the friend to change these habits.

   ඔබේ මිතුරා/මිතුරිය ඉතා කෙටි දුරක් යෑමට පවා සෑමවිටම තම නවීනතම සුඛෝපභෝගී මොටර් රථය පාවිච්චි කරයි. ඔහුගේ/ඇයගේ මෙම පුරුද්ද වෙනස් කිරීමට පෙළඹවීම සඳහා ඔහු/ඇය සමඟ ඇතිවූ දෙබසක් ලියන්න.

12. Recently, you had an opportunity to spend a week on an international space station orbiting the earth. Write an imaginative short story for young readers of science fiction about an interesting incident that happened while you were on the space station.

   පෘථිවිය වටා ගමන් කරන ජාත්‍යන්තර අභ්‍යාවකාශ මධ්‍යස්ථානයක සතියක් ගත කිරීමට ඔබට අවස්ථාවක් ලැබුණි. එහිදී සිදුවුණු සිත්ගන්නාසුළු සිදුවීක් පිළිබඳව තරුණ විද්‍යා ප්‍රබන්ධ කියවන්නන් වෙත මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

You may make notes in this space.

Question Number:

**End of Section 3**